museum of modern
and contemporary art
sri lanka

PRESS RELEASE

2022 සැප්තැම්බර්

## ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය සිය පළමු කෞතුකාගාර තීව්‍ර පුහුණු වැඩසටහන සංවිධානය කරයි.

ශ්‍රී ලංකා නූතන හා සමකාලීන කලා කෞතුකාගාරය (MMCA Sri Lanka) ශ්‍රී ලංකාවේ සංස්කෘතික අංශය තුළ වෘත්තීය ශක්‍යතාව ගොඩනැගීමේ අවශ්‍යතාවන් පිළිබඳ අවධානය යොමුකරන ඉලක්කගත පුහුණු වැඩසටහන් මාලාවක් ලෙස සංකල්පනය වී ඇති සිය පළමු කෞතුකාගාර තීව්‍ර පුහුණු වැඩසටහන පිළිබඳව සතුටින් දැනුම් දේ.

පළමු කෞතුකාගාර තීව්‍රය ඉදිරිපත්කිරීමට MMCA ශ්‍රී ලංකා නෙදර්ලන්තයේ සංස්කෘතික උරුම නියෝජිතායතනය (Cultural Heritage Agency of the Netherlands) සහ ඇමස්ටර්ඩෑම් කලා විශ්වවිද්‍යාලයේ රයින්වෝඩ් ඇකඩමිය (Reinwardt Academy) හා සහකාරත්වයෙන් කටයුතුකරන අතර, නෙදර්ලන්ත තානාපති කාර්යාලයේ නොමද සහය ඊට ලැබෙයි.

කෞතුකාගාර තීව්‍රය ඉලක්කකරන්නේ කලාකෘති එකතු සහ/හෝ ප්‍රදර්ශන වැඩසටහන් සමග වැඩකරන රාජ්‍ය හා පෞද්ගලික කලා සංවිධානවල සේවයේ නිරතවන සංස්කෘතික අංශයේ වෘත්තිකයින් ය. මෙම වැඩසටහනේ සැලකියයුතු ප්‍රමාණයේ සාකච්ඡා, ව්‍යාපෘති පාදක කරගත් ඉගැන්වීම්, සහ සහභාගිවන්නන් අතර සහයෝගිතා ක්‍රියාකාරකම් ඇතුළත්වනු ඇති අතර, ඔවුන් MMCA ශ්‍රී ලංකා කාර්ය මණ්ඩලයේ සහයෝගය ඇතිව නෙදර්ලන්තයේ සංස්කෘතික උරුම නියෝජිතායතයෙන් සහ රයින්වෝඩ් ඇකඩමියෙන් පැමිණෙන වෘත්තිකයින් විසින් ලබාදෙන ප්‍රතිචාරය සහ මගපෙන්වීමෙන් ප්‍රතිලාභ ලබනු ඇත.

සමාරම්භක කෞතුකාගාර තීව්‍රය ගෝලීය සංස්කෘතික අංශයේ වඩාත් විවාදයට ලක්වූ අංශයක්වන 'ප්‍රේක්ෂක සහභාගීත්වය' කෙරෙහි අවධානය යොමුකරයි. අමුත්තන්ගේ අත්දැකීම් වැඩිදියුණුකිරීම, ප්‍රේක්ෂකයින් වැඩිකිරීම, සහ සිය කර්තව්‍යන්ට වැඩි මහජන සබඳතාවයක් ගොඩනැගීම සඳහා දීර්ඝ-කාලීන කැපවීම්කිරීමට තමා අනුබද්ධිත ආයතනවලට උදව්කිරීම උදෙසා, ප්‍රේක්ෂක සහභාගිත්වය පිළිබඳ පොදු තේමා සහ වත්මන් විවාදවලට හුරුවීමට සහභාගිවන්නන්ට උදව්කිරීමට මෙම පුහුණු වැඩසටහන සැලසුම්කර ඇත.

Groundfloor, Crescat Boulevard
89 Galle Road
Colombo 03

Registered Address:
117 Sir Chittampalam A. Gardiner Mawatha
Colombo 02
Sri Lanka

info@mmca-srilanka.org
www.mmca-srilanka.org

“අද කෞතුකාගාර ගැන සිතන්නේ කෙසේද යන්න පිළිබඳව සංවිධායක කණ්ඩායමට විශාල දැනුමක් තියෙනවා. ඔවුන්ගේ කැපවීම, දැනුම, සහ අප්‍රමාණ ශක්තිය විශිෂ්ටයි. ඔවුන්ගේ පූර්ණ අවධානය සහ කැපවීම නිසා ඉදිරි පුහුණු වැඩසටහන් සාර්ථකවන බව මගේ විශ්වාසයයි. රයින්වෝඩ් ඇකඩමිය ඉදිරියේදී පැවැත්වෙන මෙම සහයෝගිතා පුහුණු වැඩසටහන සතුටින් අපේක්ෂා කරනවා”, ඇමස්ටර්ඩෑම් කලා විශ්වවිද්‍යාලයේ රයින්වෝඩ් ඇකඩමියේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්‍ය හා ජාත්‍යන්තර වැඩසටහන් කළමණාකර රූබන් ස්මිට් සඳහන් කළේ ය.

පළමු කෞතුකාගාර තීව්‍ර පුහුණු වැඩසටහන 2022 ඔක්තෝම්බර් 24 සිට 28 දක්වා කොළඹදී සජීවීව පැවැත්වෙනු ඇත.

අයදුම්කිරීමට බලාපොරොත්තුවන සහභාගිවන්නන් ප්‍රමුඛතා අවසන් දිනයවන 2022 ඔක්තෝම්බර් 5 හෝ ඊට පෙර education@mmca-srilanka.orgට තම CV එක හෝ résumé එක විද්‍යුත් තැපෑලෙන් එවිය යුතුය. වැඩිදුර තොරතුරු සඳහා ඔවුන්ට +94 76 22 43 120 ඇමතිය හැක.